# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2135/69 - 2019 අගෝස්තු මස 10 වැනි සෙනසුරාදා - 2019.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

12 වැනි උප වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත 12 (1) වැනි උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවි කරුණානායක වන මම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ආපදා කළමණාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යන විෂය භාර අමාත්‍යවරුන් සහ එම විෂය පවරා ඇති නැගෙනහිර පළාත් සභාවේ විෂයභාර අමාත්‍යවරුන්ද විමසා මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් බිම් ප්‍රමාණයන් ඉහත සඳහන් පනතේ කාර්යන් සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ බලශක්ති සංවර්ධන ප්‍රදේශයක් ලෙස මෙම නියමය මඟින් ප්‍රකාශයට පත් කරමි.

රවි කරුණානායක,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019, අගෝස්තු මස 7 වැනිදා,
කොළඹ 07,
අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේදීය.

***උපලේඛනය***

***බලශක්ති සංවර්ධන ප්‍රදේශ මඩකලපුව දිස්ත්‍රික්කය***

*සූර්යබලය*

I වැනි තීරයේ නිශ්චිතව සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පිහිටියා වූද II වැනි අනුරූපී තීරයේ නිශ්චිත සඳහන් නියාමකයන් වලින් සීමා සලකුණු කොට තිබෙන්නා වූ ද III වැනි අනුරූපී තීරයේ නිශ්චිතව සඳහන් හෙක්ටයාර් ප්‍රමාණයකින් යුක්ත වූ ද මුළු ඉඩම් ප්‍රමාණය සහ එහි යම් ජලාශයක් පිහිටා තිබේනම් එම ජලාශද සමඟ වේ.


1A - G 30715 — 67 (2019/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *අයිතම අංක* | *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|
| 01. | කෝරලේපත්තු (උතුර) | 280667 E, 308019 N<br>280038 E, 309284 N<br>280667 E, 309374 N<br>281211 E, 308232 N | 80.00 |

8-957/1

---

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

12 වැනි උප වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත 12 (1) වැනි උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවි කරුණානායක වන මම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය/ කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය/ ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය/ රාජ්‍ය පරිපාලන, ආපදා කළමණාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය/ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය/ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය/ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යන විෂය භාර අමාත්‍යවරුන් සහ එම විෂය පවරා ඇති ඌව පළාත් සභාවේ විෂයභාර අමාත්‍යවරුන්ද විමසා මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් බිම් ප්‍රමාණයන් ඉහත සඳහන් පනතේ කාර්යන් සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ බලශක්ති සංවර්ධන ප්‍රදේශයක් ලෙස මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

රවි කරුණානායක,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019, අගෝස්තු මස 7 වැනිදා,
කොළඹ 07,
අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේදීය.

***උපලේඛනය***

***බලශක්ති සංවර්ධන ප්‍රදේශ මොණරාගල දිස්ත්‍රික්කය***

*සූර්යබලය*

I වැනි තීරයේ නිශ්චිතව සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පිහිටියා වූද II වැනි අනුරූපී තීරයේ නිශ්චිත සඳහන් නියාමකයන් වලින් සීමා සලකුණු කොට තිබෙන්නා වූ ද III වැනි අනුරූපී තීරයේ නිශ්චිතව සඳහන් හෙක්ටයාර් ප්‍රමාණයකින් යුක්ත වූ ද මුළු ඉඩම් ප්‍රමාණය සහ එහි යම් ජලාශයක් පිහිටා තිබේනම් එම ජලාශද සමඟ වේ.

| *අයිතම අංක* | *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|
| 01. | සියඹලාණ්ඩුව | 279835 E, 173721 N<br>281184 E, 173442 N<br>281847 E, 172859 N<br>280687 E, 171375 N<br>278866 E, 171972 N | 417.00 |

8-957/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.